# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,506 — 1965 සැප්තැම්බර් 14 වැනි අඟහරුවාද — 1965.9.14**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වන කොටස: (I) වන ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම

**අංක පො/දි/1/65 දරණ ආහාර මිල ආඥාව** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

### මිළ පාලන පනත

### ආඥාව

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් අයිවන් සමරවික්‍රම වන මම, මේ ආඥාවෙන් —

(1) 1965 ජනවාරි 6 වන දින අංක 14,285 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ 1964 දෙසැම්බර් 29 වන දින අංක පො/දි/2/64 දරන ආහාර මිළ ආඥාව, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ දල බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශයේ හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහලින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස වහා ම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(3) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහලින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිළ විය යුතු ලෙස, වහාම බලපැවැත්වෙන පරිදි නියම කරමි.

(4) මෙම ආඥාවේ කාර්ය සඳහා —

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්ය සඳහා වූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් ;

(ආ) මෙහි වූ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළ බර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත් නියම කරමි.

(5) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිම තැනැත්තෙකු විසින් නොව විකිණිය යුතු බව නියම කරමි.

(6) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින් ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිළ අහලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිල සූචකයක හෝ මිල පුවරුවක සටහන්කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍ය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිළ යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කල යුතු බව නියම කරමි.

(7) මෙම ආඥාවේ කාර්ය සඳහා " රාත්තල " හෝ " රා. " යන්නෙන් ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි.

(8) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම ගැණුම්කරු ඉල්ලුව හොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැතහොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුලත් කුවිතාන්සියක් ගැණුම් කරුට දිය යුතු බව නියම කරමි.

(9) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍ය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිලත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුලත් විය යුතු බව නියම කරමි.

1965 සැප්තැම්බර් මස 7 වන දින පෙරවරු 11 ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේදී අත්සන් තබන ලදී.

අයිවන් සමරවික්‍රම,
පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක.


**1343——ආර් 8634—6,900 (65/9)**

## උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය | | |
|---|---|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය පොලොන්නරුව (ආහාර) මිල පාලන දිස්ත්‍රික්කය ප්‍රදේශ තුනකට බෙද ඇත. එම ප්‍රදේශ සඳහා පහත සඳහන් සටහන බැලිය යුතුය | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි, අධිකය | සිල්ලර වෙළන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිළට වඩා වැඩි, අධිකය | | |
| | | | ප්‍රදේශ | | |
| | | | 1 | 2 | 3 |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කොත්තමල්ලි ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| ළූනු (රතු ලූනු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) ... | ... | 2 75 | ... 0 03 | ... 0 04 | ... 0 05 |
| පියලි නොකළ උළුඳු ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| මුංඇට ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| තෝර පරිප්පු ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| කඩල පරිප්පු ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| සියඹලා ... ... ... | ... | 3 75 | ... 0 04 | ... 0 05 | ... 0 06 |
| අර්තාපල් ... ... ... | ... | 2 75 | ... 0 03 | ... 0 04 | ... 0 05 |
| රතුළූනු ... ... ... | ... | 2 75 | ... 0 03 | ... 0 04 | ... 0 05 |

**සැලකිය යුතුයි.**—මේ මිල ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණිය යුතු ලෙස නියම කර ඇති මිල නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නොවිකිණිය යුතුය.

## උපලේඛනයේ දෙවන තීරයෙහි සඳහන් ප්‍රදේශ සටහන

**අංක 1 දරණ ප්‍රදේශය—**

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :

අංක 70 දරණ ගිරිතලේ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගිරිතලේ, ජයන්ති කොළණිය, නුගගහදමන, රාජගිරිය යන ගම්.

අංක 71 ඒ දරණ හිඟුරක්ගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගොඩ සහ උල්පත් වැව යන ගම්.

අංක 71 ඊ දරණ හිඟුරක ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගල, හිඟුරක, හතමුණ හා කොටුවෙල යන ගම්.

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව :

අංක 72 ඒ දරණ උඩවෙල (අළුත් වැව) ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත් වැව, පරාක්‍රම සමුද්‍රය බ්ලොක් ඊ, ගණන්ගොල්ල හා තෝපාවැව වාරිමාර්ග නගරය යන ගම්.

අංක 73 දරණ තෝපාවැව ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ආළුලුන්දව, බැදි වැව, පොලොන්නරුව, තෝපාවැව හා කුන්කෙම යන ගම්.

අංක 73 ඒ දරණ කුඹුක්කන් ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—පැරකුම් උයන, ලක්ෂඋයන, සිංහපුර හා විජයබාහුපුර යන ගම්.

අංක 74 දරණ මානික්කම් පට්ටිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගල්ලැල්ල, කොටලිය, මානික්කම්පට්ටිය හා මාවිල යන ගම්.

අංක 74 ඒ දරණ කදුරුවෙල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කෘෂිකර්ම ගොවිපොළ කදුරුවෙල සහ මුස්ලිම් කොළණිය යන ගම්.

**අංක 2 දරණ ප්‍රදේශය—**

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :

අංක 71 දරණ මින්නේරිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බැද්දේපන්විල, හත්මිල්ලැව, කටුකැලියාව, මින්නේරිය, බත්ගම් පත්තුව, මින්නේරිය දුම්රිය නැවැතුම් පොළ හා රජ ඇළ යන ගම්.

අංක 71 සී දරණ වෙහෙර එළිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගල් අමුණ,කිරිමැටිය, රත්කොත්ගම, සන්සුන්ගම, වෙහෙර එළිය, සහ යටියල්පතාන යන ගම්.

අංක 71 බී දරණ යෝධ ඇළ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කවුඩුල්ල බ්ලොක් සී (කොටසක්) යටියල්පතාන, යෝධ ඇළ බ්ලොක් " ඒ " සහ " බී " යන ගම්.

අංක 71 ඩී දරණ උල්කටුපොත ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හිඟුරක්ගොඩ කෘෂිකර්ම ගොවිපොළ හා වින්සර්පාක් යන ගම්.

අංක 71 ඇෆ් දරණ හිඟුරක්දමන ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම්:—බී.ඕ.පී. 317, ගල්අමුණ සහ හිඟුරක්දමන යන ගම්.

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව :

අංක 72 දරණ කොටවැල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අඹන්ගඟ, කොටවැල්ල, අංගම්මැඩිල්ල, දස්තොට, දුඹුටුළු වැව, එරමුදු ඔය, කලහගල, කුකුරුමාන් වෙල හා නිකුළාවෙල යන ගම්.

අංක 73 බී දරණ කාලිංගඇළ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—ගැමුණුපුර, හේවාගම, මොනරතැන්න, පහළගම හා වැවේතැන්න යන ගම්.

අංක 73 සී දරණ පළුගස්දමන ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—පළුගස්දමන, ගල්තඹරාව හා වඩිච්චලේ යන ගම්.

අංක 75 දරණ පුදූර් ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—දිවුලාන, පුදූර් හා පුදූර් අවුතෝට්ටම් යන ගම්.

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් එගොඩ පත්තුව :

අංක 84 දරණ මනම්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—දළුකාන, ගැටමුණේ, කොස්ගහ උල්පත, මහගන්තොට, මනම්පිටිය, පුදුකොඩි හා පුදුවෙලි යන ගම්

අංක 83 දරණ කරපොළ (හැවන්පිටිය) ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—බොරවැව, ගිනි දමන, හැවන්පිටිය, කරපොළ, කොළකනාවෙලි හා වල්ලිදළුර් යන ගම්.

**අංක 3 දරණ ප්‍රදේශය—**

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් සිංහල පත්තුව :

අංක 67 දරණ මොරගස්වැව ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අඹගස්වැව, දෙහිඅත්තාව, ගල්ලිඳ, හබරණ දුම්රිය නැවතුම්පොළ, ඉළුක්වැව, මොරගස්වැව, මොරකන්ද, පොතානතල්බැද්ද, තිඹිරිගස්වැව සහ උණගොල්ලැව යන ගම්.

අංක 68 දරණ කවුඩුල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත්ඔය, කුතුලත්තාව, දිවුලන්කඩවල, ගල්ඔය, ගල්ඔය හන්දිය, හතරුස්කොටුව, කිරියගස් කොටුව, මැදිරිගිරිය, පෙතියන්නෑඔය, රත්මලේ, රොටවැව, වැකිගහේවැව හා යටියල්පතාන යන ගම්.